# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 72 දරන
# වැවිලි කර්මාන්ත සේවකයන්ට දීමනා පනත

---

[සහතිකය සටහන් කළේ 1981 නොවැම්බර් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 නොවැම්බර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි		තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 72 දරන වැවිලි කර්මාන්ත සේවකයන්ට දීමනා පනත

[සහතිකය සටහන් කළේ 1981 නොවැම්බර් මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 27/80.

**වැවිලි කර්මාන්ත සේවකයන්ට දීමනා ගෙවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—**

**1.** මේ පනත 1981 අංක 72 දරන වැවිලි කර්මාන්ත සේවකයන්ට දීමනා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. — *ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

**2.** මේ පනතේ කාර්ය සඳහා, කොමසාරිස්වරයා නිසි බලධරයා විය යුතු ය. — *නිසි බලධරයා.*

**3.** නියමිත දිනයෙහි සිට මේ පනතෙහි විධිවිධාන පහත දක්වෙන කර්මාන්තවල, එනම්— — *මේ පනත අදාළවීම.*

(අ) තේ වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයෙහි ;

(ආ) රබර් වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයෙහි ;

(ඇ) පොල් වැවීමේ කර්මාන්තයෙහි ;

(ඈ) කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයෙහි ;

(ඉ) කුරුඳු කර්මාන්තයෙහි ; සහ

(ඊ) දුම්කොළ කර්මාන්තයෙහි

වැවිලි කර්මාන්ත සේවකයන්ට සහ සේවකයන් සම්බන්ධයෙන් අදාළ විය යුතු අතර, වැවිල්ලේ ප්‍රමාණය නොතකා 5 වන වගන්තිය යටතේ සඳහන් දීමනාවලට ඒ සේවකයන්ට හිමිකම් තිබිය යුතු ය.

**4.** 3 වන වගන්තියෙහි සඳහන් සේවකයන්ට මේ පනත යටතේ යම් දීමනා ගෙවීමට සහ ගෙවීම සම්බන්ධයෙන්, ඒ ගෙවීම්, අදාළ පඩි පාලක සභාව විසින් කරන ලද තීරණයක් මගින් ගෙවිය යුතුව ඇත්තාක් මෙන්, පඩි පාලක සභා ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය. — *ඇතැම් දීමනා සම්බන්ධයෙන් පඩි පාලක සභා ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු බව.*

**5.** (1) 3 වන වගන්තියෙහි සඳහන් කවර හෝ වර්ගයක සේවකයන්ට ගෙවිය යුතු හෝ ගෙවිය හැකි යම් දීමනාවක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කළ යුතු ය. — *අමාත්‍යවරයා විසින් දීමනාව නිශ්චය කළ යුතු බව.*

(2) ගැසට් පත්‍රයෙහි තදනන්තරව පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියෙහි නිශ්චය කරන ලද ප්‍රමාණය වෙනස් කරනු ලැබිය හැකි ය.

ඒ 58759— 13,075(81/09)

වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද මේ පනත බලාත්මක හා ක්‍රියාත්මක විය යුතු බව.

6. වෙනත් යම් ලිඛිත නීතියක හෝ වාචික, ලිඛිත, ප්‍රකාශිත හෝ ගම්‍යමාන යම් සේවා නියුක්ති ගිවිසුමක හෝ කුමක් සඳහන් ව ඇත ද මේ පනතේ විධිවිධාන බලාත්මක හා ක්‍රියාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ එවැනි වෙනත් නීතියක හෝ ගිවිසුමක විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවයක් ඇති විටක එම අනනුකූලතාවයේ ප්‍රමාණයට මේ පනතෙහි විධිවිධාන එම අනෙක් නීතිය හෝ ගිවිසුම අභිබවා බලපැවැත් විය යුතු ය.

සේවා යෝජකයන් විසින් වාර්තා පවත්වාගෙන යාම.

7. (1) 3 වන වගන්තියේ දක්වා ඇති කිසියම් කර්මාන්තයක සේවකයකුගේ සේවායෝජක විසින් ඒ කර්මාන්තයෙහි සේවයේ නියුක්ත කොට ඇති සේවකයන් සම්බන්ධයෙන්—

(අ) සේවයෙහි නියුක්ත කොට ඇති එක් එක් සේවකයාගේ නම ;

(ආ) ඒ එක් එක් සේවකයා විසින් ඉටු කරනු ලබන වැඩ වර්ගය ;

(ඇ) මේ පනතේ විධිවිධාන අනුව එම සේවකයාට ගෙවනු ලබන මුදල් ප්‍රමාණය

පෙන්නුම් කරන වාර්තාවක් එම කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයෙහි තබාගෙන පවත්වාගෙන යා යුතු ය.

(2) සේවායෝජකයකු වශයෙන් (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් පවත්වාගෙන යන්නා වූ හෝ පවත්වාගෙන ගිය සෑම තැනැත්තකු විසින්ම එම වාර්තාව අවුරුදු හයක කාලයක් ආරක්ෂා කොට තැබිය යුතු අතර, පරීක්ෂණය සඳහා එම වාර්තාව ඉදිරිපත් කරන ලෙස හෝ එම වාර්තාවෙහි සත්‍ය පිටපතක් ඉදිරිපත් කරන ලෙස හෝ එවැනි පිටපතක් සකස් කිරීමට ඉඩ දෙන ලෙස හෝ නිසි බලධරයා විසින් නියම කරනු ලැබූ විට, ඔහු විසින් එසේ කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියෙන් නියමිත පරිදි වූ ලේඛනයක් පවත්වාගෙන යාම පැහැර හරින යම් සේවා යෝජකයකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට හෝ තුන් මාස යකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

නිසි බලධරයාගේ බලතල.

8. නිසි බලධරයාට—

(අ) යම් ලේඛනයක් හෝ වේතන වාර්තාවක් හෝ පරීක්ෂා කිරී මේ නැතහොත් මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරන් නේ ද කියා නිශ්චය කර ගැනීමේ කාර්ය සඳහා, පනතෙහි සඳහන් සේවකයන් සේවයෙහි නියුක්ත කරගෙන ඇති යම් ස්ථානයකට දිවා හෝ රාත්‍රී හෝ සියලු සාධාරණ වේලා වල දී ඇතුළු වීමේ සහ පරීක්ෂා කිරීමේ ; හෝ

(ආ) එම ස්ථානය පරීක්ෂා කරන විට එම වාර්තාව හෝ ලේඛනය පරීක්ෂණය සඳහා ලබා ගත නොහැකි අවස්ථාවක, එම ස්ථානයෙහි දී හෝ තම කාර්යාලයේ දී හෝ පරීක්ෂා කිරීම සඳහා එම ලේඛනය හෝ වාර්තාව නිශ්චය කරනු ලබන පසු දිනයක ඉදිරිපත් කරන ලෙස නියම කිරීමේ ; හෝ

(ඇ) එම සම්පූර්ණ ලේඛනයේ හෝ වාර්තාවේ හෝ එහි කිසියම් කොටසක හෝ පිටපත් ගැනීමේ; හෝ

(ඈ) එම ස්ථානයෙහි පවත්වාගෙන යනු ලබන යම් කර්මාන්තයක නිරත සේවායෝජකයකු යයි හෝ එම කර්මාන්තයෙහි සේවයේ නියුක්ත කොට ඇති සේවකයකු යයි විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇත්තා වූ ද එම ස්ථානයෙහි හමුවන්නා වූ ද යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමේ; හෝ

(ඉ) මේ පනත අදාළ වන යම් සේවායෝජකයකු වෙත, ලියවිල්ලක් යැවීමෙන්—

(i) එම සේවායෝජක විසින් සේවයෙහි නියුක්ත කරගෙන ඇති සියලු සේවකයන් හෝ එම සේවකයන්ගෙන් යම් නිශ්චිත වර්ගයක හෝ ආකාරයක සේවකයන් හෝ සම්බන්ධයෙන් මේ පනතේ කාර්ය සඳහා තමාට අවශ්‍ය වන විස්තර අඩංගු වාර වාර්තාවක්;

(ii) එම සේවායෝජකයා විසින් සපයන ලද යම් වාර වාර්තාවක සඳහන් විස්තර සම්බන්ධයෙන් තමාට අවශ්‍ය විය හැකි යම් තොරතුරක් හෝ පැහැදිලි කිරීමක්;

(iii) එම සේවායෝජකයා විසින් පවත්වාගෙන යනු ලබන යම් ලේඛනයක හෝ වාර්තාවක හෝ ඉන් කොටසක සත්‍ය පිටපතක්

නිශ්චිත දිනයක හෝ එදිනට පෙර තමා වෙත සපයන ලෙස විධාන කිරීමේ

බලය තිබිය යුතු ය.

සේවකයන්ට ලැබිය යුතු මුදලක් ගෙවීම පැහැර හැරීම

9. (1) තම සේවකයකුට මේ පනත යටතේ ගෙවීමට නියමිත මුදලක් ගෙවීම පැහැර හරින යම් සේවායෝජකයකු වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහසකට නොවැඩි දඩයකට හෝ හය මසකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ තම සේවකයකුට ගෙවීමට නියමිත යම් මුදලක් ගෙවීම පැහැර හැරීම සඳහා යම් සේවායෝජකයකු වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ සේවායෝජකයා වරදකරු කරනු ලැබුවේ යම් වරදක් සම්බන්ධයෙන් ද එම වරද පිළිබඳව අධිකරණය වෙත පැමිණිලි කරන ලද දිනයට පෙරාතුව ම වූ අවුරුදු හය ඇතුළත යම් අවස්ථාවක ඒ සේවකයාට හෝ වෙනත් යම් සේවකයකුට නැත හොත් සේවකයන්ට හෝ, මේ පනතේ විධිවිධාන අනුව යම් මුදලක් ගෙවීම එම සේවායෝජකයා විසින් පැහැර හැරීම පිළිබඳව සාක්ෂි ඉදිරිපත් කිරීමට අදහස් කරන බවට එම සේවායෝජකයා වෙත නියමිත ආකෘතියෙහි වූ දැන්වීමක් නඩු විභාගය ආරම්භවීමට පෙර යම් අවස්ථාවක භාර දෙනු ලැබ ඇත්නම් එසේ සාක්ෂි දෙනු ලැබිය හැකි අතර, එසේ පැහැර හැර ඇති බව ඔප්පු වූ කල්හි එම සේවා

යෝජකයාගෙන් එම සේවකයාට හෝ සේවකයන්ට ලැබිය යුතු යයි අධිකරණයට පෙනී යන මුදල ගෙවන ලෙස අධිකරණය විසින් එම සේවායෝජකයාට අණ කරනු ලැබිය හැකිය. මෙම උපවගන්තිය යටතේ ගෙවීමට අණ කරනු ලැබ ඇති යම් මුදලක් වේ නම් එය දඩයක් අය කර ගන්නා පිළිවෙළට ම අය කර ගනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියෙහි "නියමිත" යන්නෙන් 11 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් නියමිත යන්න අදහස් වේ.

මේ පනත අදාළ වන සේවකයන්ට ඇතැම් නීති අදාළ නොවන බව.

10. යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද 3 වන වගන්තියෙහි සඳහන් යම් සේවකයකුට, 1968 අංක 40 දරන සේවක යන්ගේ අතුරු අව ප්‍රමාණ දීමනාව පනතෙහි, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 17 දරන කම්කරුවන්ගේ විශේෂ දීමනා පනතෙහි, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 1 දරන කම්කරුවන්ගේ අයවැය සහන දීමනා පනතෙහි, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 18 දරන කම්කරුවන්ගේ අයවැය සහන දීමනා (අංක 2) පනතෙහි සහ 1979 අංක 65 දරන කම්කරුවන්ගේ අතිරේක දීමනා පනතෙහි සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය.

නියෝග.

11. (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතෙහි සඳහන් හෝ නියම කරනු ලැබ ඇති හෝ සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරන ලද දිනයේ හෝ නියෝගයේ සඳහන් කිසියම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසුව හැකි තාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් සිදු නොවන පරිදි ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතු දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"පොල් වැවීමේ කර්මාන්තය" යන්නෙහි, ඒ කර්මාන්තය සම්බන්ධයෙන් පඩි පාලක සභා ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1949 මාර්තු මස 30 වන දින අංක 9,961 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය" යන්නෙහි, ඒ කර්මාන්තය සම්බන්ධයෙන් පඩි පාලක සභා ආඥාපනතේ 8 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1946 අප්‍රේල් මස 4 වන දින අංක 9,546 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"කුරුඳු කර්මාන්තය" යන්නෙහි, ඒ කර්මාන්තය සම්බන්ධයෙන් පඩි පාලක සභා ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1958 ජූලි මස 4 වන දින අංක 11,410 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"කොමසාරිස්වරයා" යන්නෙන් තත් කාලයෙහි කම්කරු කොමසාරිස් ධුරය දරන තැනැත්තා අදහස් වන අතර, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකු ලෙස හෝ ජ්‍යෙෂ්ඨ කම්කරු කොමසාරිස්වරයකු ලෙස හෝ සහකාර කම්කරු කොමසාරිස්වරයකු ලෙස හෝ කම්කරු නිලධරයකු ලෙස හෝ තත් කාලයෙහි ධුරය දරන යම් තැනැත්තකු ද ඊට ඇතුළත් වේ ;

"සේවායෝජක" යන්නෙහි, යම් කර්මාන්තයක, තමා වෙනුවෙන් යම් සේවකයකු සේවයෙහි නියුක්ත කරන යම් තැනැත්තකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් යම් සේවකයකු සේවයෙහි නියුක්ත කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන්ද ඒ තැනැත්තා හෝ අදහස් වන අතර, යම් කර්මාන්තයක වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් සේවකයකු සේවයෙහි නියුක්ත කරනු ලබන්නේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා ද ඊට ඇතුළත් වේ ;

"රබර් වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය" යන්නෙහි, ඒ කර්මාන්තය සම්බන්ධයෙන් පඩි පාලක සභා ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1949 ඔක්තෝබර් මස 22 වන දින අංක 10,035 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයෙහි ඊට දී ඇති අර්ථය ඇත්තේ ය ;

"තේ වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය" යන්නෙහි, ඒ කර්මාන්තය සම්බන්ධයෙන් පඩි පාලක සභා ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1944 ජනවාරි මස 7 වන දින අංක 9,224 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයෙහි ඊට දී ඇති අර්ථය ඇත්තේ ය ;

"දුම්කොළ කර්මාන්තය" යන්නෙහි, ඒ කර්මාන්තය සම්බන්ධයෙන් පඩි පාලක සභා ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1963 ජූලි මස 31 වන දින අංක 13,713 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයෙහි ඊට දී ඇති අර්ථය ඇත්තේ ය ; තව ද

"වේතන" යන්නෙහි, පඩි පාලක සභා ආඥාපනතේ ඊට දී ඇති අර්ථය ඇත්තේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 60 කි. (විදේශීය) රු. 80 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.